# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1691/13 - 2011 පෙබරවාරි 01 වැනි අඟහරුවාදා - 2011.02.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී.-බී. 21/78.

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27 වැනි වගන්තියේ (1) වන උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන අමාත්‍ය දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බන්ඩා දිසානායක වන මා විසින්, එකී පනතේ 21 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකාවේ සබරගමුව විශ්වවිද්‍යාලයට අදාළව සාදන ලද, 1995 නොවැම්බර් මස 07 වැනි දින සහ අංක 896/2 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද සහ අවසන්වරට 2009 අගෝස්තු මස 27 වැනි දින සහ අංක 1616/36 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය මගින් අවසන්වරට සංශෝධිත නියමයේ උපලේඛනය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, මේ නියමයෙන්, එම උපලේඛනයෙහි I වැනි තීරයේ දැක්වෙන "ව්‍යවහාරික විද්‍යා පීඨය" යන අයිතමය සහ ඊට අනුරූපීව එම උපලේඛනයෙහි II වැනි තීරයේ සඳහන් වන්නා වූ සියලු අයිතමද ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්, එම නියමය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බන්ඩා දිසානායක,
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2011 ජනවාරි මස 25 වැනි දින,
කොළඹ,
උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

"උපලේඛනය

| *I වැනි තීරය* | *II වැනි තීරය* |
|---|---|
| *පීඨය* | *අධ්‍යයන අංශය* |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | 1. ස්වභාවික සම්පත් අධ්‍යයන අංශය |
| | 2. භෞතීය විද්‍යා සහ තාක්ෂණ අධ්‍යයන අංශය |
| | 3. ආහාර විද්‍යාව සහ තාක්ෂණවේදය අධ්‍යයන අංශය |
| | 4. ආගනණය සහ තොරතුරු පද්ධති අධ්‍යයන අංශය |
| | 5. ක්‍රීඩා විද්‍යා සහ ශාරීරික අධ්‍යාපන අධ්‍යයන අංශය." . |

02-406

1A - G 14086—835 (2011/02)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.